සැ. යු. - **(ii)** මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2022 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,278 - 2022 අප්‍රේල් මස 29 වැනි සිකුරාදා - 2022.04.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 842 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 857 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 0 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 මැයි මස 20 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 මැයි මස 06 වැනි දින දහවල් 12 0ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## කෑගල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(3) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

### වැරදි නිවැරදි කිරීම

1989 අංක 12 දරන (ආනුෂංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් 2021.08.20 දිනැති අංක 2,242 හා 2021.12.03 දිනැති අංක 2,257 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ IV(ආ) කොටසේ සභාව සතු මාර්ගයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලද අංක 12 කළුගල්ල ග්‍රාම නිලධාරි වසමට අයත් දෙවෙල්දෙනිය දික්කැල්ල වත්ත මාර්ගයෙහි දිග හා පළල වැරදීමකින් දිග මීටර් 183.75 ක් හා පළල මීටර් 3.00 ක් ලෙස සටහන් වී ඇති අතර එය, මාර්ගයේ දිග මීටර් 30.90ක් සහ මාර්ගයේ පළල මීටර් 2.5 ක් ලෙස නිවැරදි විය යුතුය."

ඉහත සඳහන් කරන ලද *ගැසට්* පත්‍රවලට නිවැරදි කිරීමේ සංශෝධන ලෙස ප්‍රකාශයට පත්කරනු ලැබේ.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

04-898

---

## උකුවෙල ප්‍රාදේශීය සභාව

ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය)

මෙහි දැක්වෙන උපලේඛනයේ නම් සඳහන් ස්ථානයේ 2022 වර්ෂය සඳහා එළගවමස් අලෙවි සැලක් පවත්වාගෙන යාම පිණිස බලපත්‍රයක් ඉල්ලා ඇති බැවින් ඒ අනුව එකී අයට බලපත්‍රයක් ලබා දීම ගැන උකුවෙල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ඇතුළත පදිංචි වී සිටින යම් අයෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට සාධාරණ හේතු සඳහන් කර ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට්* පත්‍රයේ පළ වූ දිනයේ සිට දි 14 ක් ඇතුළත ලියාපදිංචි කළ තැපෑලෙන් මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. ඩබ්. එම්. චේතියරත්න,
සභාපති,
උකුවෙල ප්‍රාදේශීය සභාව.

2022 අප්‍රේල් මස 07 වැනි දින,
උකුවෙල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| *ඉල්ලුම්කරුගේ නම* | *වෙළඳාමේ ස්වභාවය* | *වෙළඳාම් කරන ස්ථානය* |
|---|---|---|
| ජේ. එම්. ජෙස්මීර්,<br>අංක 241/ A, මාබේරිය,<br>උකුවෙල. | එළගවමස් | අංක 277/C, ඇල්කඩුව පාර,<br>උකුවෙල. |

04-989

**ඉපලෝගම ප්‍රාදේශීය සභාව**

මහඉළුප්පල්ලම ශ්‍රවණාගාරය නිහාල් තිලකවර්ධන ගුණානුස්මරණ ශ්‍රවණාගාරය යනුවෙන් නම් කිරීම

ඉපලෝගම ප්‍රාදේශීය සභාවට අයත් මහඉළුප්පල්ලම ශ්‍රවණාගාරය නිහාල් තිලකවර්ධන ගුණානුස්මරණ ශ්‍රවණාගාරය යනුවෙන් නම් කිරීම සුදුසු බව 2022 ජනවාරි මස 26 වැනි දින මහ සභා තීරණ අංක 501 අනුව ඉපලෝගම ප්‍රාදේශීය සභාව තීරණය කර ඇත.

ඒ සම්බන්ධයෙන් කිසියම් විරෝධතාවයක් ඇත්නම් 2022.05.13 දිනට පෙර ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

හේමන්ත රත්වත්ත,
සභාපති,
ඉපලෝගම ප්‍රාදේශීය සභාව,
ඉපලෝගම.

04-927

---

**අකුරණ ප්‍රාදේශීය සභාව**

2022 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

අකුරණ ප්‍රාදේශීය සභාව විසින් 2020.12.08 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක ඉ: 5 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බවට මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී සභා සම්මතය සඳහා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ ප්‍රකාර මධ්‍යම පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී ඇති බවත් 2022 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම් බදු මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික 4කින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් බදු 2022 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට දහය 10% ක වට්ටමක් ද, එක් එක් කාර්තුවකට අදාළ වරිපනම් බදු එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ප්‍රාදේශීය සභාව වෙත ගෙවනු ලැබුවහොත් සියයට පහක් (5%)ක වට්ටමක්ද ගෙවනු ලැබේ.

II උපලේඛනය

| අ/අ | පාරේ නම | ප්‍රතිශතය % |
|---|---|---|
| 1. | දුනුවිල පාර | 8 |
| 2. | දෙමටගස්තැන්න පාර | 8 |
| 3. | උග්ගල පාර | 8 |
| 4. | වරාගස්හින්න පාර | 8 |
| 5. | කසාවත්ත පාර | 8 |
| 6. | දොඩන්ගොල්ල පාර | 8 |
| 7. | මහපල්ලිය පාර | 8 |
| 8. | නීරැල්ල පාර | 8 |

| අ/අ | පාරේ නම | ප්‍රතිශතය % |
|---|---|---|
| 9. | හිඟුරුමුදුන පාර | 8 |
| 10. | කුරුගොඩ පාර | 8 |
| 11. | සුලේයිමාන් පාර | 8 |
| 12. | පන්ගොල්ලාමඩ පාර | 8 |
| 13 | මල්වානහින්න පාර | 8 |
| 14 | මාතලේ පාර (බලකඩුව) | 10 |
| 15 | සමාධි මාවත | 8 |
| 16 | අංකුඹුර පාර | 8 |

අයි. එම්. ඉස්තිහාර්,
සභාපති,
අකුරණ ප්‍රාදේශීය සභාව.
අලවතුගොඩ

04-782

## කෑගල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(3) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1989 අංක 12 දරන (ආනුෂාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) අ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් 24(1) ආ වගන්තිය ප්‍රකාරව 2021.12.10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ IV(ආ) කොටසේ ප්‍රකාශයට පත්කරන ලද පහත උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

පාරේ නම : මල්පන්දෙනිය වත්ත පළමු මාවත

වසම : බුළුරුප්ප

මාර්ගයේ දිග : මීටර් 46.08


මාර්ගයේ පළල : අඩි 12 යි

| මාර්ගයේ දකුණු පස | මාර්ගයේ වම්පස |
|---|---|
| 1. එම්. ඩබ්. කේ. කරුණානන්ද | 1. ඩබ්. ටී. අමරසූරිය |
| 2. ඩබ්. සුමනාවතී | 2. ඩී. එස්. හරිස්චන්ද්‍ර |
| | 3. එච්. ඒ. යූ. අයි. අබේරත්න |

බී.ආර්.එම්. කුමාරි බස්නායක (ලි.ප. අංකය 19911223)
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු සහ,
උසාවි කොමසාරිස්,
"පසන් වරුණ"
ඇකිරියගල පාර, පරගම්මන,
කෑගල්ල.

# පිඹුරු අංකය : 1055

සත්‍ය පිටපතකි
නලින්දා ක්‍රිශාන්ති,
ලේකම්,
කෑගල්ල ප්‍රාදේශීය සභාව




| | මීටර් / අඩි | මධ්‍යක පළල අඩි |
|---|---|---|
| A සිට B දක්වාදුර | 19.76 / 64.22 | 12 |
| B සිට C දක්වාදුර | 06.27/ 20.37 | 12 |
| C සිට D දක්වාදුර | 01.17 / 03.80 | 10 |
| D සිට E දක්වාදුර | 06.63 / 21.54 | 12 |
| E සිට F දක්වාදුර | 06.55 /21.28 | 12 |
| F සිට B දක්වාදුර | 05.70/ 18.5 | 13 |
| එකතුව | 46.08/ 150 | |

යොමුව :-
බනැ - බස්නැවතුම
ජටැ - ජල ටැංකිය

පරිමාණය : 1 : 1000

# සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ

## පරණකුරු කෝරළයේ මාවත පත්තුවේ

කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කෑගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ

බුලුරුප්ප කඹුඩුගම ග්‍රාම නිළධාරි වසමේ

කවුඩුගම ගමේ පිහිටි "මල්පන්දෙණිය වත්ත නොහොත් මල්පන්දෙණිය එසටේට්" නැමැති ඉඩමට

බ.මි.කේ.බැද්දෙවෙල මයා සාදන ලද අංක 5656/ඒ දරණ පිඹුරේ අංක 4 කැබැල්ලත් යාබද කැබලි වලින් කොටස් එක්කොට

දැනට භූමියේ පවතින මායිම් අනුව නැවත මැන සාදන ලද

# පිඹුර

| කැබලි අංකය | ප්‍රමාණය | | | |
|---|---|---|---|---|
| | අ | රූ | පර්චස් | වර්ග මීටර් |
| 1 | 0 | 0 | 6.90 | 174.70 |

මායිම් - ඉහත සඳහන් පරිදි.

මා විසින් මැනීම කළේ 2019. 12. 31 දින දීය

ලියාපදිංචි බලයලත් මිනින්දෝරු
2020. 01. 01

පාරේ නම : මල්වත්ත කන්ද සිට කිරිපොල දක්වා මාර්ගය

වසම : 49 A ඇවුණුගල්ල/14 C උඩකරඬුපන


මාර්ගයේ දිග : මීටර් 202

මාර්ගයේ පළල : අවම පළල මීටර් 3.7 යි

| මාර්ගයේ දකුණු පස | මාර්ගයේ වම්පස |
|---|---|
| 1. සිසිර කුමාර ජයලත් යන අයට අයිති ඉඩම | 1. සිසිර කුමාර ජයලත් යන අයට අයත් ඉඩම |
| 2. චන්ද්‍රසේන යන අයට අයිති ඉඩම | 2. චන්ද්‍රසේන යන අයට අයත් ඉඩම |
| 3. මානෙල් දිසානායක යන අයට අයිති ඉඩම | 3. සංජීවනී කුමාරි යන අයට අයිති ඉඩම |
| 4. පොඩි මැණිකේ යන අයට අයිති ඉඩම | 4. පද්මසිරි යන අයට අයිති ඉඩම |
| 5. ජයතිලක යන අයට අයිති ඉඩම | 5. ජයතිලක යන අයට අයිති ඉඩම |
| 6. අනුර විමලදාස යන අයට අයිති ඉඩම | |

බී.ආර්.එම්.කේ. බස්නායක (ලි.ප. අංකය 19911223)
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු සහ,
උසාවි කොමසාරිස්,
"පසන් වරුණ"
ඇකිරියගල පාර, පරගම්මන,
කෑගල්ල.

**පිඹුරු අංකය :1258**




| | අඩි (මධ්‍යක) | | මීටර් (මධ්‍යක) | |
|---|---|---|---|---|
| | පළල | දිග | පළල | දිග |
| AB | 24 | 43 | 4.2 | 42.6 |
| BC | 12 | 52 | 3.7 | 15.5 |
| CD | 17 | 167 | 2.5 | 40.5 |
| DE | 17 | 20 | 2.8 | 37.3 |
| EF | 13 | 29 | 2.7 | 40.0 |
| FG | 19 | 13 | 2.7 | 26.5 |
| GH | 18 | 78 | 2.8 | 33.0 |
| HI | 17 | 110 | 3.3 | 25.6 |
| IJ | 14 | 146 | 3.5 | 15.2 |
| JK | 15 | 276 | 3.2 | 69.5 |
| KL | 17 | 270 | 3.0 | 27.3 |
| LM | 14 | 175 | 2.7 | 43.9 |
| MN | 14 | 182 | 3.1 | 39.0 |
| NO | 14 | 182 | 2.6 | 22.0 |
| OP | 14 | 182 | 2.7 | 30.0 |
| PQ | 14 | 182 | 2.5 | 09.4 |
| QR | 14 | 182 | 2.9 | 31.6 |
| එකතුව | | 1561 | | 548.9 |

යොමුව :-
පා - පාලම
ලී - ලී කුඤ්ඤය

**පරිමාණය 1 : 2000**

# සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ

පරණකූරු කෝරළයේ මාවත පත්තුවේ
කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කෑගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ
මල්වත්ත කන්ද ගමේ පිහිටි "කිරිපොල ගමට යන පාර පළමු අදියර"
දැනට භූමියේ පිහිටි ආකාරයට මැන පෙන්වන

# පිඹුර

මායිම් - ඉහත සඳහන් පරිදි.

මා විසින් මැනීම කළේ 2021. 03. 11 දින දීය

| ප්‍රමාණය | කැබලි | අ. | රූ. | ප. | වර්ග මීටර් |
|---|---|---|---|---|---|
| | අංක 1 | 0 | 1 | 22.04 | 1569 |

ලියාපදිංචි බලයලත් මිනින්දෝරු
2021. 03. 15

04-897

## කෑගල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(3) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1989 අංක 12 දරන (ආනුෂාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) අ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් 24(1) ආ වගන්තිය ප්‍රකාරව 2021.11.05 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ ප්‍රකාශයට පත් කරන ලද පහත උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.


පාරේ නම : පුස්සැල්ල මැෂින්වත්ත පාර

වසම : පුස්සැල්ල

මාර්ගයේ දිග : මීටර් 202

මාර්ගයේ පළළ : අවම පළල මීටර් 3.7 යි

| *මාර්ගයේ දකුණු පස* | *මාර්ගයේ වම්පස* |
|---|---|
| 1. පී. එල්. ධර්මසේන හිමිකම් කියන පේරගහවත්ත සහ මුදුනේහේන | 1. උදේනි කුමාරි හිමිකම් කියන පේරගහවත්ත සහ මුදුනේහේන |
| 2. පී. එල්. ආරියරත්න හිමිකම් කියන පේරගහවත්ත සහ මුදුනේහේන | 2. පී. එල්. ආරියරත්න හිමිකම් කියන පේරගහවත්ත සහ මුදුනේහේන |
| 3. එස්. එම්. ජී. කේ. සමරසිංහ හිමිකම් කියන පේරගහවත්ත සහ මුදුනේහේන | 3. මීමුරේ ධම්මවංශ හිමි, හිමිකම් කියන පේරගහවත්ත සහ මුදුනේහේන |


පිඹුරු අංකය 2156
එම්. ආර්. ජයතිලක බණ්ඩා ( F. S. I. )
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු
අංක 27/7 F
මිරිහැල්ල පාර
කෑගල්ල
ලි. ප. අංක 19881029
දුරකථන අංක 035-5673948
පී. එල් ධර්මසේන හිමිකම් කියන
පේරගහවත්ත සහ මුදුන්හේන
එස්. එම්. පී. කේ. සමරසිංහ හිමිකම් කියන
පේරගහවත්ත සහ මුදුන්හේන
පී. එල් ආරියරත්න හිමිකම් කියන
පේරගහවත්ත සහ මුදුන්හේන
උදේනි කුමාරි හිමිකම් කියන
පේරගහවත්ත සහ මුදුන්හේන
මැණික්වත්තපාර
මිමුරෙ ධම්මවංශ හිමි හිමිකම් කියන
පේරගහවත්ත සහ මුදුන්හේන
යොමුව
කවැ - කම්බි වැට
පැවැ - පැලෑටි වැට
ගබැ - ගල් බැම්ම
ආතා - ආධාරක තාප්පය
අනි - අනිසිස්විත
ඉ - ඉවුර
ප්‍රමාණය :- හෙක්ටයාර් 0.0899
දුර :- මීටර 202 යි
අවම පළල :- මීටර 3.7 යි
පරිමාණය 1 : 1000
සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ
කිනිගොඩ කෝරලේ දෙයාලදහමුන පත්තුවේ පුස්සැල්ල ගමේ පිහිටි මැණික්වත්තපාර මැන පෙන්වන
පිඹුර
2021 පෙබරවාරි මස 20 වැනි දින මනින ලදී
2021-02-24

## රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව

### සම්මත අතුරු ව්‍යවස්ථාව

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව විසින් 2022 මාර්තු මස 24 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 05.02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

නිශාන්ත ජයසුන්දර,
සභාපති,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව.

2022 මාර්තු මස 31 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු, 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ ඌව පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ සාදන ලදුව අංක 2267/44 හා 2022.02.17 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද්ද වූ සම්මත අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව ඉහත සඳහන් අයුරු ව්‍යවස්ථා රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බලපැවැත්වීමටත්, ක්‍රියාත්මක කිරීමටත් යෝජනා කරන අතර, මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළ කරන දින සිට ක්‍රියාත්මක කිරීමට, පිළිගැනීමට හා වැළඳගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ රිදී මාලියද්ද ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නිවේදනය

**1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123 වන වගන්තිය යටතේ පළ කරනු ලබන නිවේදනය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) සමඟ කියවිය යුතු 126 (vii)(උ) උප වගන්තියේ විධිවිධාන අනුව රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව විසින් සාදනු ලද රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ වාහන නතර කිරීම හා වාහන හැසිරවීම නම් වූ මෙහි පහත උපලේඛනයේ සඳහන් අතුරු ව්‍යවස්ථාව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කළ බව මෙයින් නිවේදනය කරමි.

**ඒ.ජේ.එම්.මුසම්මිල්,**
ඌව පළාත් ආණ්ඩුකාරවර.

වර්ෂ 2022 පෙබරවාරි 10 දින,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

**රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාර්ගවල රථ වාහන නතර කිරීම හා එකී මාර්ගවල රථ වාහන හැසිරවීම විධිමත් කිරීම,අධීක්ෂණය හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ප්‍රාදේශීය සභා සභා බල ප්‍රදේශයේ වාහන නතර කිරීම හා වාහන හැසිරවීම විධිමත්ව හා ක්‍රමවත්ව පවත්වාගෙන යාම මගින් මගී ආරක්ෂාව හා රථවාහන අනතුරු වළක්වා ගැනීම උදෙසා මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කෙරේ.

3. ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය සමඟ කියවිය යුතු 126 (Vii) (උ) උප වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව සම්පාදනය කර ඇත.

4. (අ) රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ කිසියම් වීථියක හෝ මාර්ගයක කවර වූ හෝ කොටසක -

I. රථවාහන නවතා තැබීම තහනම් කිරීම,
II. සීමා කිරීම,
III. එක් පැත්තක පමණක් වාහන නවතා තැබීමට ඉඩදීම ,
IV. බඩු බෑම හෝ පැටවීම තහනම් කිරීම හෝ සීමා කිරීම,
V. මගීන් බැස්සවීම හෝ නැග්ගවීම තහනම් කිරීම,
VI. බස් නැවතුම් ස්ථාන නම් කිරීම
VII. තනි අතට පමණක් වාහන ධාවනය කරන වීථි හෝ මාර්ග නම් කර ගමන් කළහැකි දිශාව තීරණය කිරීම,

සඳහා රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවට බලය තිබිය යුතු ය.

(ආ) ප්‍රාදේශීය සභාව විසින් (අ)ඡේදය යටතේ වන කිසියම් සීමා කිරීමක් කරනු ලැබීමෙන් අනතුරුව එකී සීමා කිරීම පිළිබඳ මාර්ග සංඥා අදාළ ස්ථානයේ සවිකිරීමට සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතුය. එකී සීමා කිරීම් පිළිබඳ මාර්ග සංඥා , මෝටර් වාහන පනතේ 164වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 237 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ 1987 මාර්තු මස 13 වන දිනැති අංක 444/18 දරන I වන කොටස (I) වන ඡේදය අති විශෙෂ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කරනු ලැබ ඇති නියෝගවලට අනුව වියයුතුවත් හැර එකී නියෝග වලට කලින් කල කරනු ලබන සංශෝධනයන්ට යටත් විය යුතු ය.

5. ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත හෝ ප්‍රාදේශීය සභා ප්‍රදේශය හරහා වැටී ඇති කිසියම් වීථියක හෝ මාර්ගයක ධාවනය කරන ඕනෑම වාහනයක රියැදුරෙකු විසින් 4 වන අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදයේ නියමයන් යටතේ සවිකරනු ලැබ ඇති මාර්ග සංඥාවකින් හෝ සංඥාවලින් නිරූපණය කෙරෙන නියමයන් පිළිපැදීම කරනු ලැබිය යුතු ය.

6. සෑම රථගාලකම නවතා තැබීමට පැමිණෙන වාහන ඇතුල් කිරීමේ දොරටුව හා පිටවීමේ දොරටුව පහසුවෙන් කියවීමට හැකිවන ආකාරයෙන් භාෂාත්‍රයෙන් දැන්වීමක් සවිකර තිබිය යුතු අතර, එකී ස්ථානය ඇතුළත වාහන නවතා තැබීමට පැමිණීමේදී සහ ඉන් පිටතට ගැනීමේදී ධාවනය කළ යුතු දිශාව පහසුවෙන් හඳුනාගැනීමට හැකිවන ආකාරයෙන් සෙන්ටි මීටර් 20 පළලින් යුතු සුදු පාට රේඛාවක් සහිත ඊතල සලකුණු කර තිබිය යුතු ය.

7. සෑම රථගාලකම බිම තාර දමා හෝ කොන්ක්‍රීට් දමා තිබිය යුතු අතර, එකී රථගාල පරිහරණය කරන්නන්ගේ පාවිච්චිය සඳහා ස්ත්‍රී හා පුරුෂ දෙපාර්ශවයට වෙන් වෙන් වූ වැසිකිළි තනා තිබිය යුතුය. එසේම ස්ථානය තුළ රැස්වන ජලය පහසුවෙන් ගලා යාමට ප්‍රමාණවත් කාණු පද්ධති තනා තිබිය යුතු ය.

8. සෑම රථගාලකම පරිශ්‍රය තුළ එකතුවන කසළ දිනපතා බැහැර කිරීමට සහ එකී ස්ථානයේ පවත්නා වැසිකිළි දිනපතා විෂබීජ නාශක යොදා පිරිසිදු කිරීමටත් සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතුය.

9. සෑම රථගාලකම වාහන නවතා තැබීමට ඉඩකඩ වෙන් කිරීමේ දී රථගාල ඇතුළට පැමිණෙන සහ ඉන් පිටවන වාහනවලට ගමන් කිරීම සඳහා ප්‍රමාණවත් ධාවන මංතීරු ඇති කර තිබිය යුතු ය.

10. කිසියම් වාහනයක් රථගාල ඇතුළත ධාවනය කිරීමේ දී හා ගාල් කිරීමේ දී, ඒ තුළ ගාල් කර ඇති වෙනත් යම් වාහනයකට බාධාවක් නොවන පරිදි එක් එක් වාහනය නවතා තැබීමට රථගාල ඇතුළත ප්‍රමාණවත් ඉඩකඩ වෙන්කර තිබිය යුතු අතර, එක් එක් වාහනය සඳහා වෙන්කර ඇති සීමාව පෙන්නුම් කරන සෙන්ටි මීටර් 10ක පළලින් යුතු සුදුපාට රේඛාවකින් සලකුණු කර තිබිය යුතු ය.

11. කිසියම් රථගාලක නවතා තබන යම් වර්ගයක වාහනයක් නවතා තැබීම වෙනුවෙන් අයකිරීමට ප්‍රාදේශීය සභාව සභා තීරණය කළ ගාස්තු ප්‍රමාණය එකී රථගාලේ ඇතුල්වීමේ දොරටුවේ පැහැදිලිව පෙනෙන පරිදි භාෂාත්‍රයෙන් ප්‍රදර්ශනය කිරීමට ඉඩ සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

12. සභාව විසින් නිකුත් කරනු ලබන පළමුවන උපලේඛනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රය මගින් වාහන නවතා තැබීමේ ස්ථානයක් සඳහා ප්‍රාදේශීය සභාවේ අවසර පත්‍රයක් ලබා ගැනීමට ඉල්ලුම් කළ යුතු අතර, ඒ සඳහා සභාව විසින් තීරණය කරන ලද මුදලක් ගෙවා අයදුම්පත්‍රය ලබා ගත යුතු ය. මෙම අයදුම්පත්‍ර ගාස්තුව සභාව විසින් ගනු ලබන තීරණ අනුව කලින් කලට සංශෝධනය කළ හැකි ය.

13. 12 වන ව්‍යවස්ථාවේ සඳහන් අවසර පත්‍රය නිකුත් කිරීමේ දී පහත සඳහන් සුදුසුකම් අයදුම්කරු විසින් සපුරා තිබිය යුතු ය.

I. අයදුම්කරු සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙක් යන්න තහවුරු කළ යුතු අතර, ඔහු වසර තුනක ස්ථිර පදිංචි කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

II. මෝටර් රථ පදවන්නා අයිතිකරු නම්, ඔහුගේද පදවන්නා කුලී රියදුරකු නම් ඔහුගේ සහ අයිතිකරුගේද පහත සඳහන් ලේඛනවල ඡායා පිටපත් අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කර ඔවුනගේ අනන්‍යතාවය තහවුරු කළ යුතු ය.

- මෝටර් රථ හිමිකරුගේ ජාතික හැඳුනුම්පත හා වලංගු රියදුරු බලපත්‍රය
- මෝටර් රථයේ ලියාපදිංචි සහතිකය
- කුලී රියදුරාගේ ජාතික හැඳුනුම්පත හා වලංගු රියදුරු බලපත්‍රය
- රථයේ රක්ෂණ සහතිකය
- ආදායම් බලපත්‍රය

14. (අ) කිසියම් රථගාලක නවතා තබන වාහනවලින් ගාස්තු අයකිරීම සඳහා මෙහි මින් මතු "රථගාල භාරකරු " යනුවෙන් හඳුන්වනු ලබන-

I. ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්ත කවර හෝ සේවකයෙකු, හෝ
II. ප්‍රාදේශීය සභාව විසින් ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීම මගින් තෝරා ගනු ලැබූ කිසියම් සාර්ථක ටෙන්ඩර්කරුවකු හෝ එකී ටෙන්ඩර්කරු විසින් නම් කරනු ලැබූ ඔහුගේ අනුයෝජිතයෙකු,

යෙදවීම් කළ හැකිය.

(ආ) එසේ වුවද කිසියම් රථගාලක වාහන නවතා තැබීම වෙනුවෙන් අයකරනු ලබන ගාස්තුව 11 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලැබූ ගාස්තුවේ ප්‍රමාණය නොඉක්මවිය යුතුවාත් හැර එක් එක් වාහනය නවතා තැබීම වෙනුවෙන් අයකළ ගාස්තු ප්‍රමාණය මේ කොටසේ දෙවන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරගත් කුවිතාන්සියක සටහන් කර වාහනයේ රියැදුරා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

15. සෑම රථගාල භාරකරුවෙකු ම ඒ කාර්යයයේ නියුක්ත වන කාලය ඇතුළත ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන හා රථගාල භාරකරු පහසුවෙන් හඳුනා ගැනීමට හැකිවන ආකාරයේ ඇඳුමකින් සැරසී සිටීමට සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

16. (අ) 14 වන අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදය යටතේ නවතා තැබීමට ඉඩදෙනු ලැබීමට තීරණය කර ඇති කිසියම් වර්ගයක රථයක් නවතා තැබීමට රථගාලට ඇතුල්කරන අවස්ථාවේදී එකී රථ ගාලේ ඇතුල්වීමේ දොරටුව ළඟදී එකී වාහනයේ රියැදුරා වෙත මේ කොටසේ තෙවන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කළ ඇතුල්වීමේ අවසරය දැක්වෙන ඇතුල්වීමේ අවසර කාඩ් පත්‍රයක් නිකුත් කිරීම රථගාල භාරකරුගේ කාර්යය විය යුතුය.

(ආ) ඇතුල්වීමේ අවසරපත්‍රයක් සහිත සෑම වාහනයක්ම රථගාලෙන් පිටත්ව යාමට පෙර -

I. (අ) ඡේදයේ සඳහන් කාඩ් පත්‍රය රථගාල භාරකරුට ආපසු භාරදීම.

II. 11 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලැබූ ප්‍රමාණයන්ට ගැලපෙන වාහන නවතා තැබීමේ ගාස්තුව රථගාල භාරකරුට ගෙවීම; සහ

III. ගෙවන ලද ගාස්තුවට ගැලපෙන 14 වන අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදයේ සඳහන් කුවිතාන්සියක් ලබාගැනීම.

එකී වාහනයේ රියැදුරාගේ කාර්යය විය යුතු ය.

17. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ රථගාල භාරකරු හෝ යම් පොලිස් නිලධාරියෙකු විසින් කිසියම් රථගාලක නවතා තිබෙන යම් වාහනයක අයිතිකරුගෙන් නැතහොත් රියදුරුගෙන් වාහනය සඳහා නිකුත් කළ ඇතුල්වීමේ අවසර කාඩ්පත පරීක්ෂා කිරීම සඳහා ඉල්ලා සිටි අවස්ථාවක ද එය පරීක්ෂා කිරීම සඳහා ලබා දීම එකී වාහනයේ අයිතිකරුගේ හෝ රියදුරුගේ කාර්යය විය යුතුය.

18. ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත පිහිටුවා තිබෙන යම් රථගාලක් ඇතුළත නවතා තබන -
(අ) රජයේ වාහනවලට,
(ආ) පළාත් සභාවේ වාහනවලට,
(ඇ) පළාත තුළ සංස්ථාපනය කර ඇති කිසියම් පළාත් පාලන ආයතනයක වාහනවලට,

මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අදාළ නොවිය යුතුය. එසේ වුවද කිසියම් රාජ්‍ය සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක යම් වාහනයකට එකී විධිවිධාන මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල සඳහන් ආකාරයෙන් ම අදාළ විය යුතුය.

19. කිසියම් රථගාලක ඇතුල්වීමේ අවසර කාඩ්පත්‍රයක් නොමැතිව නවතා තබා ඇති කිසියම් වාහනයක් එකී රථ ගාලෙන් ඉවත්කිරීමට සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ රථගාල භාරකරු හෝ ක්‍රියා කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

20. 5 වන අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණ ද 4 වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලැබ සවිකරනු ලැබූ කිසියම් මාර්ග සංඥාවක් මඟින් නියම කරනු ලැබ ඇති සීමාවන් -

(අ) එකී වීථියේ හෝ මාර්ගයේ කිසියම් කොටසක හෝ ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ වෙනත් කවර හෝ වීථියක හෝ මාර්ගයක ආසන්නයේ ඇති කිසියම් ගොඩනැගිල්ලක හෝ ඒ ආසන්නයේ ඇතිවන යම් ගින්නක් හෝ වෙනත් යම් ආපදාවක් මැඩ පැවැත්වීමේ කාර්යය සඳහා යොදා ගන්නා ප්‍රාදේශීය සභාවේ ගිනි නිවන රථයක් හෝ වෙනත් කවර වූ හෝ වාහනයක් සඳහා,

(ආ) එකී වීථියේ හෝ මාර්ගයේ කිසියම් කොටසක හෝ ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ වෙනත් කවර හෝ වීථියක හෝ මාර්ගයක ඇතිවන වාහන තදබදයක් මඟ හැරවීම සඳහා හෝ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත ඇතිවන වෙනත් කිසියම් අනපේක්ෂිත තත්ත්වයක් පාලනය කිරීම සඳහා යම් පොලිස් නිලධාරියෙකු විසින් අවස්ථාවෝචිත පරිදි කරනු ලබන විධානයක් අනුව ක්‍රියාකිරීම සඳහා,

එකී 5 වන අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කිරීමක් ලෙස සැලකීම නොකළ යුතු ය.

21. (අ) කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් රථගාලක නවතා තැබීමට ඉඩ දීමට ප්‍රාදේශීය සභාව තීරණය කර ඇති වර්ගයක වාහනයක් වන්නේ නම් මිස වෙනත් කවර වූ වාහනයක් හෝ මෝටර් වාහනයක් නොවන කවර වූ වාහනයක් රථගාලක නවතා තැබීම හෝ රථගාලකට ඇතුල් කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ කරනු නොලැබිය යුතුය.

(ආ) රථගාලක නවතා තිබෙන කිසියම් වාහනයක් එකී රථගාලෙන් ඉවතට ගැනීම සඳහා එකී වාහනය පන ගැන්වීමට නොහැකි වන අවස්ථාවක දී, එකී වාහනය ඇදගෙන යාම සඳහා රථගාල තුළට පැමිණෙන කිසියම් වෙනත් යම් වාහනයක් එකී රථගාල තුළට ඇතුල් කිරීමට ප්‍රමාණවත් ඉඩකඩක් ඇත්තේ නම් එසේ පැමිණෙන වෙනත් වාහනවලට කවර හෝ බාධාවක් හෝ හානියක් වන ආකාරයෙන් ඇදගෙනයාම නොකළ යුතු ය.

22. කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් රථගාලක ඇතුළත -

(අ) වාහන සේදීම හෝ එසේ කිරීමට සැලැස්වීම,

(ආ) යම් වාහනයක් ඉවත් කර ගැනීමේ කාර්යය සඳහා එකී වාහනය පන ගැන්වීමට අත්‍යවශ්‍ය අලුත්වැඩියාවක් හෝ රෝදයක් මාරු කිරීමේ කාර්යයක් හෝ නොවන වෙනත් කවර හෝ අලුත්වැඩියාවක් කිරීම,

(ඇ) (අ) ඡේදයේ සඳහන් කිසියම් අලුත්වැඩියා කිරීමක දී අවස්ථාවෝචිත කරුණු පිළිබඳ සැලකිල්ලට ගැනීමේ දී හැර අනවශ්‍ය වන්නාවූ හෝ බාධාකාරී වන්නාවූ හෝ කිසියම් ශබ්දයක් හෝ ශබ්ද ඇති කිරීම,

(ඈ) එකී රථගාල භාරකරුගේ අවසරයක් නොමැතිව වාහනය නවතා ඇති ස්ථානයක සිට එම රථගාලේම වෙනත් ස්ථානයකට ගෙන ගොස් නැවතීම,

(ඉ) එකී රථගාලේ ධාවන මං තීරු හෝ ඇතුල්වීමේ හා පිටවීමේ දොරටු අවහිර වන සේ වාහන නවතා තැබීම,

(ඊ) අනතුරක් වැළැක්වීම හෝ වාහනයේ හෝ එහි රැඳී සිටින්නන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමේ හෝ කාර්යය සඳහා හැර යම් වාහනයක සවිකර ඇති අනතුරු ඇඟවීමේ උපකරණ නාද කිරීම,

(උ) ගාල් කර ඇති හෝ එකී රථගාලට ඇතුල්වන හෝ ඉන් පිටවන කිසියම් වාහනයක නලාව හැඬවීම,

(ඌ) මත්පැන් පානය කිරීම හෝ බුලත් කෙළ ගැසීම හෝ අසභ්‍ය වචන පාවිච්චි කිරීම හෝ කළකෝලාහල කිරීම හෝ සදාචාරාත්මක නොවන ක්‍රියාවක යෙදීම හෝ,
නොකළ යුතුය.

23. කිසියම් රථගාලක නවතා තබන කවර හෝ වාහනයක ආරක්ෂාව පිළිබඳ වගකීම එකී වාහනය රථගාල තුළ නවතා තබන තැනැත්තා වෙත තිබිය යුතුවාත් හැර යම් වාහනයකට රථගාල ඇතුළත දී සිදුවන කිසියම් අලාභයක් හෝ හානියක් හෝ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව හෝ සභාපතිවරයා හෝ රථගාල භාරකරු හෝ වගකීමට යටත් නොවිය යුතුය.

24. 6 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් කිසියම් රථගාලක් ඇතුළත පිහිටි ධාවන මං තීරුවක වාහන ධාවනය කළ යුතු දිශාව පෙන්වන සලකුණු කර ඇති දිශාවට පටහැනි දිශාවට කවර හෝ අවස්ථාවක කිසියම් වාහනයක් ධාවනය කිරීම නොකළ යුතුය.

25. කිසියම් රථගාලක කර ඇති යම් ඉදිකිරීමකට හෝ ඒ තුල පවත්නා යම් උපකරණයකට හෝ හානිකිරීම හෝ විකෘති කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

26. පොදු වාහන නතර කිරීමේ ස්ථානයකට හෝ කුලී රථගාලකට වාහනයක් ඇතුල් කිරීමට හෝ වාහනයක් පිටතට ගැනීම අවහිර වන පරිදි කිසිවෙකු විසින් වාහන නවතා තැබීම නොකළ යුතුය.

27. කිසියම් රථගාලක් ඇතුළත වාහන නවතා තැබීම වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ආකාරයේ ගාස්තුවක් අයකළ හැකිය.

28. (අ) ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුල, මෙහි මින් මතු "රථගාල" යනුවෙන් හඳුන්වනු ලබන මෝටර් වාහන නවතා තැබීමේ කාර්යය සඳහා -

I. ප්‍රාදේශීය සභාව සතු කිසියම් ඉඩමක් , හෝ

II. වෙනත් කිසියම් අධිකාරයක් සමග ඇති කර ගනු ලබන ගිවිසුමක් අනුව එකී අධිකාරය සතු කිසියම් ඉඩමක්, හෝ වෙන් කිරීමට ප්‍රාදේශීය සභාවට බලය තිබිය යුතු ය.

(ආ) කිසියම් රථගාලක නවතා තැබිය හැකි වාහන වර්ගය සහ එකවර නවතා තැබිය හැකි උපරිම වාහන සංඛ්‍යාව කොපමණද යන්න කලින් කල තීරණය කිරීම ප්‍රාදේශීය සභාව විසින් කරනු ලැබිය හැකිය.

29. සෑම රථගාලකම අවම වශයෙන් වාහන ඇතුල්කිරීම සඳහා එක් දොරටුවක් සහ පිටවීම සඳහා එක් දොරටුවක් ද බැගින් දොරටු දෙකක් වෙන්කර තිබිය යුතුය. එසේ වුවද රථගාල ඇතුළත වාහන හැරවීම සඳහා ම වෙන් වූ කොටසක් ඇති කර තබන්නේ නම් හා එකවර වාහන දෙකක් දෙපසට ගමන් කළ හැකි ද්විත්ව ධාවන මං තීරු හා දොරටුවේ ඉඩකඩ සලස්වා ඇති අවස්ථාවක වාහන ඇතුල්වීම සහ පිටවීම සඳහා එක් දොරටුවක් පමණක් තිබීමට සැලැස්විය හැකිය.

30. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධානයන් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩ කිරීම වරදක් වන්නේ ය.

31. මෙම අතුරු ව්‍යවස්ථා කඩ කිරීම සම්බන්ධව නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයකින් වරදකට වරදකරුවීමෙන් අනතුරුව ඉහත සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටක ඉහත කී වගන්තියේ සඳහන් අතිරේක දඩයකටද යටත් විය යුතු ය.

32. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

"සභාපතිවරයා" යන්නෙන් රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ තත්කාලයෙහි සභාපතිධූරය දරන තැනැත්තා අදහස් වන්නේය.

"ප්‍රාදේශීය සභාව " යන්නෙන් රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවද අදහස් වන්නේය.

"ලේකම්වරයා" යන්නෙන් රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ ලේකම්ධූරය දරන තැනැත්තා අදහස් වන්නේය.

"මාර්ගය" යන්නෙන්, ප්‍රාදේශීය සභාව සතු කිසියම් මං මාවතක්, මාර්ගයක්, මහා මාර්ගයක්, පටුමගක්, වීථියක්, දෙවැටක්, පඩිපෙළක්, ඒදණ්ඩක් හෝ මඟී පාලමක් අදහස් වන අතර ප්‍රාදේශීය සභාව සතු කිසියම් මංමාවතකට, මාර්ගයකට, මහා මාර්ගයකට, පටු මගකට, වීථියකට, දෙවැටකට, පඩි පෙළකට සම්බන්ධව සවිකර හෝ සිටුවා ඇති කිසියම් දුර

පෙන්වන සලකුණක්, මායිම් ගලක්, මායිම් කණුවක්, පහන් කණුවක්, පාලමක්, කවර හෝ ආකාරයක, බෝක්කුවක්, දියපැන්නුමක්, තාප්පයක්, ආරුක්කුවක්, වේල්ලක්, කාණුවක්, සොරොව්වක්, ආධාරක බැම්මක්, අත්වැලක්, දම්වැලක්, වැටක්, සංඥාපුවරුවක්, මාර්ග නාම පුවරුවක් හෝ යාබද පදික වේදිකාවක් ද ඊට ඇතුළත් විය යුතුය.

"වාහනය" යන්නෙන්, මෝටර් වාහන පනතේ කිසියම් මෝටර් වාහනයක් සඳහා දෙන ලද අර්ථ නිරූපනයට ගැලපෙන කිසියම් මෝටර් වාහනයක් අදහස් විය යුතුය.

**පළමු උපලේඛනය**

12 වැනි අතුරු ව්‍යවස්ථාව

වාහන නැවතුම් පොළ අවසර පත්‍රයක් ලබා ගැනීම සඳහා
අයදුම් පත්‍රය

01.
I. අයදුම්කරුගේ නම : ..........................................................................................
II. ස්ථිර පදිංචි ලිපිනය : ..........................................................................................
III. වරිපනම් අංකය : ..........................................................................................
IV. ස්ථිර පදිංචියට අදාල පළාත් පාලන ආයතනය : ..........................................................................................
V. ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................

02.
I. මෝටර් රථ වර්ගය : ..........................................................................................
II. වාහන ලියාපදිංචි අංකයඃ ..........................................................................................
III. පදවන්නා අයිතිකරු ද නැත්නම් කුලී රියදුරුද යන වග : ..................................................
(අ) අයිතිකරුනම් වලංගු රියදුරු බලපත් අංකය : ..................................................
(ආ) කුළී රියදුරකු නම්
(අ) රියදුරුගේ නම : ..........................................................................
(ආ) ස්ථිර පදිංචි ලිපිනය : ..........................................................................
(ඇ) ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................
(ඈ) වලංගු රියදුරු බලපත් අංකය : ..........................................................................

03. බලපත්‍රය ඉල්ලුම් කරනු ලබන වාහන නැවතුම්පොළ : ..........................................................................
04. බලපත්‍රය ඉල්ලුම් කරන කාලය : මාසයකට / මාස 03 කට / අවුරුද්දකට

මා විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත්, යම් හෙයකින් එම තොරතුරු සාවද්‍ය බව තහවුරු වුවහොත්, මාගේ වාහන නැවතුම්පොළ අවසර පත්‍රය පූර්ව දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමට යටත් බවත්, ප්‍රාදේශීය සභාව විසින් පනවා ඇති වාහන නැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන් පිළිපැදීමටත් එකඟ වෙමි.

දිනය : ............................................ අත්සන : ...................................................

............................................................................................ මහත්මා / මහත්මියට .................................. අංක දරන රථය ....................
..............................දරන නැවතුම් පොළෙහි නැවැත්වීම සඳහා අවසර පත්‍රය .................................................... කාලයකට ලබා දීම අනුමත කරමි.

දිනය : .....................................

.........................................................
සභාපති,
ප්‍රාදේශීය සභාව/රිදීමාලියද්ද.

**දෙවන උපලේඛනය**

14 වැනි අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදය

| | | |
|---|---|---|
| වාහනයේ අංකය | - | ................................................ |
| වාහනයේ වර්ගය | - | ................................................ |
| අයකළ ගාස්තුව | - | .............................................. |
| වලංගු කාලය | - | ................................................ |
| නිකුත් කළ දිනය | - | ................................................ |
| නිකුත් කළ නිලධාරියාගේ නම හා අත්සන | - | ................................................ |

**තෙවන උපලේඛනය**

16 වන අතුරු ව්‍යවස්ථාවේ (අ) ඡේදය

ලදුපත් අංකය අංකය/No.
Receipts No.: 000
000

**වාහන නවතා තැබීමේ බලපත්‍රය**

නම :
හැඳින්වීමේ අංකය :
ගාස්තුව :
නැවතුම්පොල :
වලංගු කාලය :
දිනය :

සභාපති/ලේකම්,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව.

- මෙය සෙ.මී. 13 න් යුත් විශ්කම්භයක් සහිත වෘත්තයකි.
- පසුබිම ලාදුඹුරු (Light maroon colour) පැහැති වර්ණයෙන් යුත් ප්‍රාදේශීය සභා නාමය Water mark ලෙස යොදා සැකසූ ස්ටිකරයක් හෝ අවසර පත්‍රයකි.

04 - 727

# විවිධ දැන්වීම්

## වෙංගල සෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාව

### ව්‍යාපාර බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා ආඥාපනතේ අංක 147, 148, 149, 150, 152::1),109:B) 127 වැනි කොටස්වලට අනුකූලවත් වෙංගල සෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාවේ අංක VCKPS/2021/11/1 හා 09.11.2021 දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණය ප්‍රකාරවත් 2022 ජනවාරි මාසයේ සිට පහත සඳහන් උපලේඛනයේ දී දක්වන ලද ව්‍යාපාරවලින් ව්‍යාපාර බද්ද හෝ වරිපනම් හා වාර්ෂික බදු පනවන බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා වන ව්‍යාපාර බද්ද හා ගාස්තු 2022-01-01 දින සිට වෙංගල සෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය වෙත ගෙවිය යුතුයි.

සුප්පයියා ජෙගතීෂ්වරන්,
සභාපති,
වෙංගලසෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාව.

**උපලේඛන 01**

| *අනු. අංකය* | *ව්‍යාපාරයේ ස්වභාවය* | *බදු ගාස්තු රු. ශත* |
|---|---|---|
| 01 | තේ කඩයක් | 500 0 |
| 02 | තේ කඩයක් හා කෑම කඩයක් පවත්වාගෙන යාම | 1,250 0 |
| 03 | සාමාන්‍ය කෑම කඩයක් පවත්වාගෙන යාම | 600 0 |
| 04 | බේකරියක් පවත්වාගෙන යාම | 1,750 0 |
| 05 | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 06 | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 400 0 |
| 07 | මිනි සිනමාහලක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 08 | සිමෙන්ති භාණ්ඩ විකුණුම්හලක් පවත්වාගෙන යාම | 1,750 0 |
| 09 | ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීම හා අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 |
| 10 | යකඩ ද්‍රව්‍ය විකිණීම හා අලෙවි ස්ථානයක් පවත්වා ගෙන යාම | 2,250 0 |
| 11 | සිමෙන්ති පැකට් 25ට වැඩි ප්‍රමාණයක් අලෙවි ස්ථානයක් පවත්වා ගෙන යාම | 2,200 0 |
| 12 | දුව කර්මාන්ත ශාලාවක් (මානව සම්පත්) පවත්වාගෙන යාම | 2,500 0 |
| 13 | ලී මෝලක් පවත්වාගෙන යාම (යන්ත්‍රානුසාරයෙන්) | 3,000 0 |
| 14 | අයිස් නිෂ්පාදන ස්ථානයක් හෝ අලෙවිහලක් පවත්වාගෙන යාම | 1,100 0 |
| 15 | පාවහන් - අලෙවිහලක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 16 | අයිස්ක්‍රීම් නිෂ්පාදනය | 2,100 0 |
| 17 | අයිස්ක්‍රීම්, ශීතකළ බීම අලෙවිහලක් පවත්වාගෙන යාම | 1,250 0 |
| 18 | පැණි රස ටොෆි අලෙවිහලක් පවත්වාගෙන යාම | 400 0 |
| 19 | එළවළු අලෙවිහලක් පවත්වාගෙන යාම | 1,200 0 |

| *අනු. අංකය* | *ව්‍යාපාරයේ ස්වභාවය* | *බදු ගාස්තු රු. ශත* |
|---|---|---|
| 20 | කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් හා අලෙවිහලක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 21 | තොග වෙළඳාම සඳහා හොණ්ඩර් 10ක් හෝ ඊට වඩා වැඩි පිටි, සීනි, සහල්, ලුණු අළෙවිහලක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 22 | කුළුබඩු වෙළඳසැලක් පවත්වාගෙන යාම | 1,650 0 |
| 23 | සහල් අළෙවිහලක් පවත්වාගෙන යාම | 1,200 0 |
| 24 | මත්පැන්, රටබීමහලක් හෝ අලෙවිහලක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 25 | රා එකතු කිරීමේ මධ්‍යස්ථානයක් හා අලෙවිහලක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 26 | බයිසිකල් අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 |
| 27 | යතුරුපැදි අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 2,250 0 |
| 28 | යතුරුපැදි අලෙවිහලක් පවත්වාගෙන යාම | 2,000 0 |
| 29 | වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම | 2,000 0 |
| 30 | මෝටර් රථ අමතර කොටස් හලක් හෝ අලෙවිහලක් පවත්වාගෙන යාම | 2,250 0 |
| 31 | පාපැදි අමතර කොටස් හලක් හෝ අලෙවිහලක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 32 | විදුලි උපකරණ, විදුලි පංකා මෝටර් අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 1,250 0 |
| 33 | රූපවාහිනි යන්ත්‍ර, ගුවන්විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 1,200 0 |
| 34 | විදුලි උපකරණ අළෙවිහලක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 35 | බටහිර පෞද්ගලික රෝහලක් පවත්වාගෙන යාම | 2,000 0 |
| 36 | බටහිර ඖෂධ අළෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 |
| 37 | ප්ලාස්ටික් භාණ්ඩ අළෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 38 | ප්‍රසන්ටි, වාර්නිෂ් ආලේපන අළෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 39 | වී කෙටීම, සහල් පිටි අඹරන මෝලක් පවත්වාගෙන යාම | 2,000 0 |
| 40 | මිරිස්, කෝපි ඇඹරුම් හලක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 41 | ඡායාරූපාගාරයක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 42 | රූපවාහිනි යන්ත්‍ර, සිනමා කැසට් සංයුක්ත තැටි, අලෙවිකිරීම හෝ කුලියට දීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 43 | ඡායා පිටපත් කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 44 | විශේෂ උත්සව සඳහා භාණ්ඩ කුලියට ලබා දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,500 0 |
| 45 | වානිජ අරමුණින් යුතුව , සන්නිවේදන උපකරණ, ෆැක්ස් සේවාවක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 46 | සහල් මෝලක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 47 | අධ්‍යාපන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 48 | බැංකු වෙළඳාම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 49 | විවිධ සේවා සමුපාකාර සමිතියක් පවත්වාගෙන යාම | 1,500 0 |

| අනු. අංකය | ව්‍යාපාරයේ ස්වභාවය | බදු ගාස්තු රු. ශත |
|---|---|---|
| 50 | උත්සව ශාලාවක් පවත්වාගෙන යාම | 2,500 0 |
| 51 | රෙදිපිළි අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 |
| 52 | රසායනික පොහොර, කෘෂි උපකරණ, අලෙවිහලක් පවත්වාගෙන යාම | 2,000 0 |
| 53 | ස්වර්ණාභරණ අලෙවිහලක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 54 | මැහුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 55 | ගෑස් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 56 | ගඩොල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 57 | ගව ගාලක් තබා ගැනීම (ගවයින් 10 ට අඩු) | 500 0 |
| 58 | ගව ගාලක් තබා ගැනීම (ගවයින් 10 ට වැඩි) | 1,000 0 |
| 59 | පපඩම් නිෂ්පාදනාගාරයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 60 | සන්නිවේදන කුළුණක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 61 | කළුගල් මෝලක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 62 | බොරළු වලක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 63 | පොත් අලෙවිහලක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 64 | වාහන භාණ්ඩ රැගෙන ගොස් අලෙවි කිරීම | 3,000 0 |
| 65 | කුකුළන් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 66 | පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 67 | සති පොළ | 1,500 0 |
| 68 | කුකුළු ගොවිපලක් පවත්වාගෙන යාම (50 ට අඩු) | 1,000 0 |
| 69 | කුකුළු ගොවිපලක් පවත්වාගෙන යාම (50 ට වැඩි) | 2,000 0 |
| 70 | ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් හා අලෙවිහලක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 71 | අලංකාර මල් පැළැටි අලෙවි හලක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 72 | පුටු සහ උත්සව භාණ්ඩ කුළියට දීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 |
| 73 | කණ්නාඩි සවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 74 | ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 75 | කළුගල් ගබඩා කිරීමේ, අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 76 | වාහන සර්විස් කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 77 | ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 78 | කුඩා කර්මාන්ත නිෂ්පාදන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 79 | කුඩා ප්‍රමාණයේ පෙට්ටි කඩයක් පවත්වාගෙන යාම | 750 0 |
| 80 | කුඩා ප්‍රමාණයේ කුළුබඩු අලෙවිහලක් පවත්වාගෙන යාම | 1,200 0 |
| 81 | පිරිපහදු පානීය ජලය අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම (කුඩා) | 1,500 0 |

| *අනු. අංකය* | *ව්‍යාපාරයේ ස්වභාවය* | *බදු ගාස්තු රු. ශත* |
|---|---|---|
| 82 | පිරිපහදු පානීය ජලය අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම (විශාල) | 2,750 0 |
| 83 | පළතුරු වෙළඳාම් කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 84 | රූපලාවන්‍ය භාණ්ඩ අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 85 | දූව භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 2,000 0 |
| 86 | රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම | 2,000 0 |
| 87 | බීජ, ධාන්‍ය වර්ග, පැළ වර්ග අලෙවි හලක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 88 | සත්ත්ව ආහාර, ඖෂධ වර්ග අලෙවි හලක් පවත්වාගෙන යාම | 2,000 0 |
| 89 | කඩල කරත්තයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 90 | කොන්ත්‍රාත් වැඩපලක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 91 | ජ්‍යොතිෂ කාර්යාලයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 92 | සෙබමාලෙ කඩයක් පවත්වාගෙන යාම | 1,000 0 |
| 93 | සත්ත්ව ගොවිපලක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 94 | ගමනාගමන සේවාවක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 95 | ඉඩම්, ගොඩනැගිලි ගැනුම් හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 96 | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 1,700 0 |
| 97 | පෞද්ගලික සමාගමක් පවත්වාගෙන යාම | 3,000 0 |
| 98 | වෙළඳ භාණ්ඩ අලෙවි නියෝජිත (වාහන) | 3,000 0 |
| 99 | රූපලාවන්‍ය සායනික මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,500 0 |
| 100 | ස්වර්ණාභරණ උකස් සාප්පුවක් | 3,000 0 |
| 101 | සූර්ය ආලෝකයෙන් විදුලිය නිෂ්පාදනය | 3,000 0 |

**උපලේඛනය 02**

**අනෙකුත් අයකිරීම්**

| *අනු. අංක* | *අයකිරීම් ස්වභාවය* | *ගාස්තුව රු. ශත* |
|---|---|---|
| | **කාඩ්පත් ආකෘතිපත්‍ර** | |
| 01 | ගව ගාස්තු (එක් ගවයෙක් සඳහා) | 50 0 |
| 02 | පාපැදි සඳහා වන අංක තහඩු 01 | 05 0 |
| 03 | පාපැදි සඳහා අංක තහඩුවට අදාල ආකෘතිය 01 | 20 0 |
| 04 | ඖෂධ කාඩ්පත ආකෘතිය (එක් පුද්ගලයෙකු සඳහා) | 30 0 |
| 05 | ඖෂධ කාඩ්පත තැන්පත් (එක් පුද්ගලයෙකු සඳහා) | 250 0 |
| 06 | වෙළඳ බලපත්‍ර පෝරමය | 50 0 |

**ප්‍රචාරක දැන්වීම්**

| *අනු. අංක* | *අයකිරීම් ස්වභාවය* | *ගාස්තුව රු. ශත* |
|---|---|---|
| 01 | ප්‍රචාරක නාම පුවරු සඳහා ගාස්තු (වර්ග අඩියකට) | 100 0 |
| 02 | පුවරුවක් ප්‍රදර්ශනය කිරීම (දිනකට) | 1,000 0 |

**මැටල්, බොරළු, කළුගල් කැණීම් හා ප්‍රවාහනය කිරීම**

| *අනු. අංක* | *අයකිරීම් ස්වභාවය* | *ගාස්තුව රු. ශත* |
|---|---|---|
| 01 | පරීක්ෂණ ගාස්තු (කිලෝමීටරයකට) | 50 0 |
| 02 | මැටල්, පස් කැණීම් හා ප්‍රවාහනය කිරීම (කියුබ් 01) | 100 0 |
| 03 | කළුගල්, බොරළු හා ප්‍රවාහනය කිරීම (කියුබ් 01) | 67.50 |
| 04 | බොරළු කැණීම් හා ප්‍රවාහනය කිරීම් ප්‍රාදේශීය සභාවට අයත් වැඩපොළකින් (කියුබ් 01) | 250 0 |

**ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා වන අවසරය**

| *අනු. අංක* | *අයකිරීම් ස්වභාවය* | *ගාස්තුව රු. ශත* |
|---|---|---|
| 01 | ගොඩනැගිලි ඉදිකිරීමට අදාළ අවසරය ඉල්ලුම්පත් (අ) | 150 0 |
| 02 | ගොඩනැගිලි ඉදිකිරීමට අදාළ අවසරය ඉල්ලුම්පත් (ආ) (ඊ) | 150 0 |
| 03 | පදිංචිවීමේ සහතිකය | 200 0 |
| 04 | පදිංචි වීමේ සහතිකය | 3,000 0 |
| 05 | සීමා රේඛා සලකුණු සහතිකය | 600 0 |

**අනෙකුත්**

| *අනු. අංක* | *අයකිරීම් ස්වභාවය* | *ගාස්තුව රු. ශත* |
|---|---|---|
| 01 | නළ ළිං නඩත්තු ගාස්තුව (අවුරුද්දකට) | 1,500 0 |
| 02 | කල්ලාරු 31 දින සිහිකිරීමේ චාරිත්‍රය (එක් චාරිත්‍රයක් සඳහා) | 1,500 0 |
| 03 | ක්‍රීඩා පිට්ටනි ගාස්තු (එක් දිනකට) | 2,000 0 |
| 04 | වෙළඳනාම ලියාපදිංචි ගාස්තු | 1,000 0 |
| 05 | විශේෂ උත්සව අවස්ථා සඳහා සතුන් මැරීම සඳහා ගාස්තු (ගවයෙක් සඳහා) | 1,000 0 |
| 06 | වෙළඳ මධ්‍යස්ථාන සඳහා කුණු කසළ බැහැර කිරීමේ ගාස්තු (මාසයකට) | 50 0 |
| 07 | මුහුදු මාළු වෙළඳාම (කිලෝවක් සඳහා) | 15 0 |
| 08 | වැව් මාළු වෙළඳාම (කිලෝවක් සඳහා) | 10 0 |

### උපලේඛනය 03

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 66 වන වගන්තිය ඇතුළත් වන පරිදි අයාලේ යන ගවයින් පාලනය කිරීමට ගාස්තු පැනවීම.

| *අනු. අංක* | *අයකිරීම් ස්වභාවය* | *ගාස්තුව රු. ශත* |
|---|---|---|
| 01 | සතුන් ඇල්ලීම (ගවයෙකු සඳහා) | 500 0 |
| 02 | දඩ මුදල (ගවයෙකු සඳහා - අල්ලන ස්ථානයේදීම ගෙවන්නේනම්) | 1,000 0 |
| 03 | දඩ මුදල (පැවරීමේ ගාස්තු - කාර්යාලයට ගෙනයාමෙන් පසුව ගෙවන්නේනම්) | 500 0 |
| 04 | ගවයන් නඩත්තු කිරීමේ වියදම - (ගවයෙකු සඳහා දිනකට) | 250 0 |

අල්ලන ගවයෙකු දින 10 ක් ඇතුළත අයිතිකරු විසින් නිදහස් කරගනු නොලැබුවහොත් සභාව මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය 04

### පුස්තකාල ගාස්තු අයකිරීම්

| *අනු. අංක* | *අයකිරීම් ස්වභාවය* | *ගාස්තුව රු. ශත* |
|---|---|---|
| 01 | සාමාජික ගාස්තු - ආකෘති පත්‍ර ගාස්තු | 15 0 |
| 02 | නව සාමාජික ගාස්තු (වැඩිහිටි) | 120 0 |
| 03 | සාමාජිකත්වය අලුත් කරවා ගැනීමේ ගාස්තු (වැඩිහිටි) | 50 0 |
| 04 | නව සාමාජික ගාස්තු (ළමයින්) | 50 0 |
| 05 | සාමාජිකත්වය අලුත් කරවා ගැනීම - (ළමුන්) | 50 0 |
| 06 | අදාළ කාලසීමාව තුළ නැවත භාර නොගත් පොතක් සඳහා දඩ මුදල (දිනකට) | 3 0 |

සාමාජිකයින් විසින් අතුරුදහන් කෙරෙන පොතක් සඳහා වන අය කිරීම් - පොතක වටිනාකම සමග පොතක් බඳින්න වැයවන ගාස්තුව අය කෙරේ.

### උපලේඛනය 05

### ප්‍රාදේශීය සභා සතු වාහන (රියැදුරු එක්ව) කුලියට දීම පිළිබඳව ගාස්තු අයකිරීම

| *අනු. අංක* | *අයකිරීම් ස්වභාවය* | *ගාස්තුව රු. ශත* |
|---|---|---|
| 01 | මෝටර් ග්‍රේඩර් (පැයකට) | 5,060 0 |
| 02 | ජේ. සී. බී. (පැයකට) | 3,600 0 |
| 03 | රෝලර් (පැයකට) | 3,475 0 |
| 04 | සී සෑමේ යන්ත්‍රය ටේලරය සහිතව (දවසකට පැය අටක්) | 5,000 0 |
| 05 | ට්‍රැක්ටරය ජල බවුසරය සහිතව (දවසකට පැය අටක්) | 5,000 0 |

**උපලේඛනය 06**

**ප්‍රාදේශීය සභාවේ ජල බවුසර් කුළියට දීම පිළිබඳ ගාස්තු අයකිරීම්**

| *අනු. අංක* | *අයකිරීම් ස්වභාවය* | *ගාස්තුව රු.* |
|---|---|---|
| 01 | මීටර් 1000 ක ජල ටැංකියක් හා ජල ටැංකි ස්ටෑන්ඩ් සහිතව (දිනකට) | 200 0 |
| 02 | මීටර් 2000 ක ජල ටැංකියක් හා ජල ටැංකි ස්ටෑන්ඩ් සහිතව (දිනකට) | 400 0 |

04-929/1

---

## වෙංගලචෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාව

වෙංගලවෙඩ්ඩිකුලම් ප්‍රාදේශීය සභාව විසින් වෙංගලචෙට්ටිකුලම් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පාරිසරික සංරක්ෂණ බදු පැනවීමට 1980 වර්ෂයේ අංක 47 දරන ජාතික පාරිසරික පනතේ ප්‍රකාරව අංක 1533/16, 2008 වර්ෂයේ ජනවාරි මස 25 වැනි දින ප්‍රකාශයට පත් ගැසට් නිවේදනයටද, අංක 1534/18, 2008 වර්ෂයේ පෙබරවාරි මස 01 වැනි දින ප්‍රකාශයට පත් කළ *ගැසට්* නිවේදනයට ප්‍රකාරව ඇ කොටසේ සඳහන් කරුණු ප්‍රාදේශීය සභාවට ලබා දී ඇත. පහත දැක්වෙන දැනුම්දීම් ප්‍රකාරව අප සභාවෙන් පාරිසරික ආරක්ෂණ ගාස්තු වෙංගලචෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ මෙම පනත ක්‍රියාත්මක කරන අතර පහත උපලේඛනයේ සඳහන් කර්මාන්ත මත මධ්‍යම පාරිසරික අධිකාරියෙන් පනවන පරිදි ආකෘතිපත්‍ර ගාස්තු, පරීක්ෂණ ගාස්තු, බලපත්‍ර ගාස්තු ආදින් පනවා අය කළ යුතු අතර මෙමගින් අය කරනු ලබන ගාස්තු 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ පනවා අය කරනු ලබන ගාස්තුවලට වඩා අමතර ගාස්තුවක් වූ අතර ඒවා කෙරෙහි හානි පමුණුවන්නක් නොවේ. මෙම ගාස්තු 01.01.2022 වැනි දින සිට ගෙවිය යුතු බවට 09.11.2021 දිනැති අංක 2021/11/1 සභාවේ තීරණයක් මගින් සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සුප්පයියා ජෙගතීෂ්වරන්,
සභාපති,
වෙංගලචෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාව.

01. සියලු වාහන සඳහා වන ඉන්ධන පිරවුම් හල (ද්‍රව පෙට්‍රෝලියම් හා ද්‍රවකෘත පෙට්‍රෝලියම් වායු)
02. සේවක සංඛ්‍යාව 10 දෙනෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත
03. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25 ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන පොල්තෙල් සිඳීමේ කර්මාන්තයන්
04. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25 ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන මධ්‍යසාර අඩංගු නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
05. වියලි ක්‍රියාවලි සහිත වී මෝල්
06. මසකට නිෂ්පාදන ධාරිතාව කිලෝග්‍රෑම් 1000 ට අඩුවන ඇඹරුම් හල්
07. දුම්කොළ වේලීමේ කර්මාන්ත
08. සල්ෆර් දුම් ගැසීම සහිත එක් ක්‍රියාවලියක දී නිෂ්පාදන ධාරිතාව කිලෝගෑම් 500 හෝ එයට වැඩි ධාරිතාවක් සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත
09. කෑමට ගන්නා ලුණු ඇසිරීමේ සහ සැකසීමේ කර්මාන්තය
10. ක්ෂණික තේ කර්මාන්තශාලා හැර අනෙකුත් තේ කර්මාන්තශාලා

11. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්තශාලා

12. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදන කිරීමේ කර්මාන්ත

13. දිනකට මෙට්‍රික් ටොන් 20 ට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත හුණු පෝරණු

14. ප්ලාස්ටර් ඔෆ් පැරිස් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත හෝ සේවකයින් 25 ට අඩු සංඛ්‍යාවක් සේවයේ නියුක්ත පිගන් ඇති මැටි භාණ්ඩ කර්මාන්තශාලා

15. සියලු බෙලිකටු ඇඹරීමේ කර්මාන්තශාලා

16. උළු සහ ගඩොල් කර්මාන්ත

17. එක් වරකට එක් බෝර වලක් බැගින් පුපුරවමින් මසකට ඝන මීටර් 600 ක නිෂ්පාදන ධාරිතාවකට අඩු මිනිස් ශ්‍රමය හා පුපුරන ද්‍රව්‍ය භාවිතයෙන් සිදු කරනු ලබන කැණීම්

18. දිනකට ඝන මීටර් 50 ට අඩු දැව ඉරීමේ ධාරිතාවක් ඇති ලී මෝල හෝ ලී බොරොන් පිරියම් ක්‍රමය භාවිතයෙන් දැව පිලියම් කිරීමේ කර්මාන්ත හෝ ලී පදම් කිරීමේ ක්‍රියාවලියේ නිරත කර්මාන්තශාලා

19. කම්කරුවන් 5 ට වැඩි 25 ට අඩු කම්කරුවන් යොදවා ඇති බහුකාර්ය වඩු කර්මාන්ත යන්ත්‍රෝපකරණ භාවිතා කරන වැඩපොළ, දැව කැටයම් කර්මාන්තය හෝ දැව වැඩපොළවල්

20. 5 ක් හෝ ඊට වඩා වැඩි 20 ට අඩු කාමර සහිත නේවාසික පහසුකම් ලබා දෙන හෝටල්, ආගන්තුක නිවාස, තානායම්

21. වාහන අලුත්වැඩියා කටයුතු හෝ නඩත්තු කටයුතු භාවිතා වන ගරාජයන්

22. ශීතකරණ හා වායු සමනය කරන උපකරණ අළුත්වැඩියා කිරීම, පවත්වාගෙන යාම, සවිකිරීම, නිෂ්පාදනය කිරීම, ආදී කටයුතු සිදු කරන වැඩපළවල් නඩත්තු පහසුකම් (ගරාජ ඇතුළුව) ජංගම වායුසමනය කිරීම හෝ ප්‍රවාහන වායුසමනය කිරීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම් ආශ්‍රිත ක්‍රියාකාරකම් ඇතුළුව

23. වාහන නඩත්තු කටයුතු සිදු කෙරෙන ස්ථාන හැර කන්ටේනර් හා ලොරි ගාල් කිරීමේ ස්ථාන

24. සේවකයින් 10 ක් හෝ ඊට වඩා වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන සියලුම වර්ගයේ විදුලි උපකරණ හෝ ඉලෙක්ට්‍රොනික භාණ්ඩ අළුත්වැඩියා කිරීම

25. ඊයම් උණු කර අකුරු මුද්‍රණය හා අකුරු සාදන උපකරණ

**උපලේඛන 08**

**ගාස්තු අය කිරීම්**

| *අනු. අංක* | *අය කිරීම් ස්වභාවය* | *ගාස්තුව රු.* |
|---|---|---|
| | *බලපත්‍ර ගාස්තු* | |
| 01 | නව වාහනයක් වේනම් | 4,000 0 |
| 02 | නැවත අලුත් කරවා ගැනීම වාහනයේ සියල්ලටම | 4,000 0 |
| | පරීක්ෂණ ගාස්තු | |
| | ආයෝජන රු. 250,000/- හෝ ඊට වඩා අඩු | 3,000 0 |
| | ආයෝජන රු. 250,000/- රු. 500,000/- | 3,750 0 |
| | ආයෝජන රු. 500,000/- රු. 1,000,000/- | 5,000 0 |
| | ආයෝජන රු. 1,000,000/- ඊට වඩා වැඩි | 10,000 0 |

**ආකෘති පත්‍ර ගාස්තු**

| *අනු. අංක* | *අය කිරීම් ස්වභාවය* | *ගාස්තුව රු.* |
|---|---|---|
| 01 | පාරිභාවිත ආරක්ෂණ ගාස්තු ඉල්ලුම් පත්‍රය | 100 0 |
| 02 | පාරිභාවිත ආරක්ෂණ ගාස්තු අලුත් කරවා ගැනීම් පත්‍රය | 100 0 |

04-929/2

---

**වෙංගලචෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාව**

## ගොඩනැගිලි ඉදි කිරීමට අවසර ගාස්තු

ප්‍රාදේශීය සභා බල සීමාව තුළ 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ කොටස 47 සිට 59 දක්වා ද 1978 වර්ෂයේ අංක 41 දරන නගර සංවර්ධන පනතේ 21 වන කොටස යටතේ නිවාස හා ඉදි කිරීම් පොදු පහසුකම් පිළිබඳ අමාත්‍යාංශයෙන් රෙගුලාසිත් ඇතුළත්ව ඉදිරිපත් කරන ලද ගොඩනැගිලි ඉල්ලුම්පත්, ඉඩම් කට්ටි බෙදීම් හා නගර සැලසුම් ආදී පරීක්ෂා කර අනුමැතිය ලබා දෙනු ලැබේ.

ඉහත විෂය සඳහා 1986.03.10 වන දින ප්‍රකාශයට පත්කළ *ගැසට් නිවේදන* අංක 329/9 යටතේ ස්ථාපනය කළ නගර සංවර්ධන අධිකාරියේ රෙගුලාසි හා විධි විධානයන් ඉන් පසුව සංශෝධනයන්ට අනුකූලව සිදු කෙරෙන ගාස්තු අය කිරීම් 2022.01.01 සිට ගෙවිය යුතු බවත් 2021.11.09 දිනැති අංක 2021/11/1 දරන සභා තීරණයක් මගින් සම්මත කළ බව මෙයින් මහජනතාව වෙත දන්වනු ලැබේ.

සුප්පයියා ජෙගතීශ්වරන්,
සභාපති,
වෙංගලචෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාව.

04-929/3

---

**වෙංගල චෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාව**

## ත්‍රීරෝද රථ නැවතුම් පොළවල් සඳහා වන ගාස්තුව

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තිය සමග කියවිය යුතු 148 වන වගන්තියේ පැවරී ඇති පහත (1) වෙන්ගලචෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාවේ අංක VCK/2021/11/1 අංක හා 2021.11.09 වන දිනැති සභා තීරණයන්හට අනුකූලව වෙංගලසෙට්ටිකුලම් ප්‍රදේශය තුළ 2022 වර්ෂයේ පළමුවන තීරුවේ සඳහන් වන නැවතුම් පොළවල් සේවා සැපයීමටත් 2 වන තීරුවේ සඳහන් වී ඇති ගාස්තු 2022 ජනවාරි මස 01 වැනි දින සිට වෙන්ගලචෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාවේ කාර්යාලයට ගෙවිය යුතු බව මෙයින් දන්වනු ලැබේ.

සුප්පයියා ජෙගතීශ්වරන්,
සභාපති,
වෙංගලචෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාව.

**තීරුව 01**

***ත්‍රිරෝද රථ නැවතුම් පොළ***

1. සෙට්ටිකුලම් මූලික රෝහල් ආපන ශාලාව ඉදිරිපිට මුහත්තාන්කුලම් 6 වන හරස් වීදියට වම්පස පිහිටි මැදවච්චිය - මන්නාරම ප්‍රධාන මාර්ගයේ මීටර් 10ක්

2. සෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රධාන දොරටුවෙන් මීටර් 20ක දුරින් මීටර් 10ක්

3. සෙට්ටිකුලම් මහජන බැංකුව ඉදිරිපිට වම්පසින් මීටර් 05ක

4. සෙට්ටිකුලම් සමෘද්ධි බැංකුව ඉදිරිපිට වම්පසින් මීටර් 05ක

5. ආණ්ඩියාපුලියන්කුලම් - මන්නාර් - මැදවච්චිය ප්‍රධාන මාර්ගයට යාබදව මීටර් 08 ක්

6. මාන්කුලම් - මරදම්මඩු මාර්ගයේ හන්දිය සිට මීටර් 20ක දුරක ප්‍රමාණය

7. වීරපුරම් - නේරියකුලම් - වවුනියා ප්‍රධාන මාර්ගයේ උතුම් මවුතුමියගේ ශුද්ධ වූ පිළිරුව හන්දිය සිට වම්පසින් මීටර් 10ක දුර ප්‍රමාණයක්

8. සුඩුවෙන්දපුලවු - පාසලේ ප්‍රධාන දොරටුවට දකුණු පසින් වවුනියාව - නේරියකුලම් ප්‍රධාන මාර්ගයේ මීටර් 10ක දුර ප්‍රමාණයක්

9. මුදලියාර්කුලම් - 03 වන පටුමගට වම්පසින් කඩ සංකීර්ණයට නුදුරින් මැදවච්චිය මන්නාරම ප්‍රධාන මාර්ගයේ මීටර 10ක දුර ප්‍රමාණයක්

10. පරමනාලන්කුලම් - වවුනියා - මන්නාරම ප්‍රධාන මාර්ගයේ පෙරියතම්පනෙයි හන්දිය සිට දකුණු පසින් මීටර් 10ක ප්‍රමාණයක්

**තීරුව - 02**

01. ත්‍රීරෝද රථ (දිනකට) රු. 10.00

02. ත්‍රීරෝද රථ ලියාපදිංචි කිරීමේ ගාස්තුව - රු. 1,500.00

සුප්පයියා ජෙගතීෂ්වරන්,
සභාපති,
වෙංගලචෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාව.

04-929/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.